රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:20/99

මගේ අංකය :-ආIV/4/2-20
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1999.08.18.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**1999 පළාත් සභා මැතිවරණයට තරග කිරීම සඳහා රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ හෝ ඉල්ලා අස්වූ හෝ රාජ්‍ය <u>නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම.</u>**

1999 පළාත් සභා මැතිවරණය සඳහා තරග කිරීමට සේවයෙන් විශ්‍රාම ලැබූ හෝ සේවයෙන් ඉල්ලා අස්වූ නිලධාරියකු විසින් පහත සඳහන් කරුණු සනාථ කරමින් තමා නැවත සේවයේ පිහිටුවන ලෙස 1999 දෙසැම්බර් 31 දිනට පෙර අදාළ පත් කිරීමේ බලධාරියා වෙත අභියාචනයක් ඉදිරිපත් කළහොත්, අදාළ තනතුර තවමත් පුරප්පාඩු වී තිබේ නම්, එම අභියාචනය සලකා බලා නැවත සේවයේ පිහිටුවීමට රජය තීරණය කර ඇත.

(අ) ආයතන සංග්‍රහයේ XXXII පරිච්ජේදයේ 1:1 උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට හිමිකමක් නොමැති අයෙකු වීම.

(ආ) තමා සේවයෙන් විශ්‍රාම ගනු ලැබුවේ හෝ ඉල්ලා අස්වූයේ 1999 පළාත් සභා මැතිවරණයට තරග කිරීම සඳහා බවත්, එසේ තරග කොට ප්‍රමාණවත් මනාප සංඛ්‍යාවක් නොලැබීම නිසා තමාට පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්වීමට නොහැකි වූ අයෙකු වීම.

(ඇ) තමා විකල්ප විශ්‍රාම ගැනීමේ වයසට අඩු අයෙකු වීම.

02. මෙවැනි නිලධාරියකු විශ්‍රාම ලැබූ හෝ සේවයෙන් ඉල්ලා අස්වූ හෝ දින සිට නැවත සේවයේ පිහිටුවන දිනය අතරතුර කාලය ඔහු ආයතන සංග්‍රහයේ XII පරිච්ජේදයේ 17:2 උප වගන්තිය යටතේ උපයාගත් නිවාඩු වලට හිලව් කළ යුතු ය. ඉන් ඔබ්බට තවත් අතිරේක කාලයක් වෙතොත් එය වැටුප් රහිත නිවාඩු සේ සැලකිය යුතුය.

03. විශ්‍රාම ලැබූ නිලධාරියකු නැවත සේවයේ පිහිටු වීමේදී ඔහු ලබා ගත් විශ්‍රාම වැටුපක් හෝ විශ්‍රාම පාරිතෝෂිකයක් වෙතොත් ඒ සියල්ල ආපසු අය කර ගත යුතු අතර, ඔහුගේ ඉදිරි විශ්‍රාම වැටුප් නැවැත්වීම සඳහා අදාල බලධාරීන් වෙත වහාම දැන්විය යුතුය.

04. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 1999 වර්ෂයේ පවත්වන ලද පළාත් සභා මැතිවරණයට පමණක් අදාල වේ.

පී.ඒ.සේනාරත්න
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.